රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.02.08**

**නිවේදන අංකය: 144/2021**
**නිකුත් කළ වේලාව:21:00**

අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)
ප්‍රවෘත්ති කර්තෘ

<u>ප්‍රවෘත්ති නිවේදනය</u>

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 09ක් තහවුරු කරන ලද අතර ඒ අනුව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන මුළු කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 365 කි.

**01.** කොළඹ 15 ප්‍රදේශයේ පදිංචි 95 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. 2021 පෙබරවාරි 05 වන දින නිවසේදී මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

**02.** අනුරාධපුර පදිංචි 61 හැවිරිදි කාන්තාවකි. අනුරාධපුර ශික්ෂණ රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසු හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2021 පෙබරවාරි 08 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් 19 ආසාදනය සමඟ ලේ විෂවීමේ කම්පනය සහ හෘදය අක්‍රීය වීමයි.

**03.** කුරුණෑගල පදිංචි 50 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. කුරුණෑගල ශික්ෂණ රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසු හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේ දී 2021 පෙබරවාරි 08 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාවයි.

**04.** මීගමුව ප්‍රදේශයේ පදිංචි 70 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. වැලිසර ලය රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේදී 2021 පෙබරවාරි 07 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ශ්වසන පද්ධතිය අක්‍රීය වීම සහ කොවිඩ් නියුමෝනියාවයි.

**05.** කොළඹ 12 ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි කාන්තාවකි. කොළඹ ජාතික රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසු හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේදී 2021 පෙබරවාරි 07 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ පිළිකා රෝගී තත්ත්වයයි.

**06.** කයිට්ස් පදිංචි 76 හැවිරිදි කාන්තාවකි. කොළඹ පෞද්ගලික රෝහලක සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව යාපනය ශික්ෂණ රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේදී 2021 පෙබරවාරි 07 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්නේනේ කොවිඩ් නියුමෝනියාව සහ අංශභාග රෝගී තත්ත්වයයි.

**07.** හොරණ ප්‍රදේශයේ පදිංචි 61 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. මහරගම අපේක්ෂා රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව මුල්ලේරියාව මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේදී 2021 පෙබරවාරි 08 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ ලේ විෂවීම, කොවිඩ් නියුමෝනියාව සහ පෙනහළු පිළිකා රෝගී තත්ත්වයයි.

**08.** ගුරුදෙණිය ප්‍රදේශයේ පදිංචි 42 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. මහනුවර මහ රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව හෝමාගම මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේදී 2021 පෙබරවාරි 01 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ ලේ විෂවීමයි.

**09.** මැවනැල්ල ප්‍රදේශයේ පදිංචි 73 හැවිරිදි පිරිමි පුද්ගලයෙකි. මාවනැල්ල මූලික රෝහලේ සිට කොවිඩ් 19 ආසාදිතයෙකු ලෙස හඳුනා ගැනීමෙන් පසුව තෙල්දෙණිය මූලික රෝහල වෙත මාරු කර යවා ඇති අතර එම රෝහලේදී 2021 පෙබරවාරි 08 වන දින මියගොස් ඇත. මරණයට හේතුව ලෙස දැක්වෙන්නේ කොවිඩ් නියුමෝනියාව සහ හෘද රෝගී තත්ත්වයයි.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්